විදුලි පණිවුඩ : " විශ්‍රාම වැටුප් " කොළඹ
தந்தி : "ஓய்வூதியம் " கொழும்பு
Telegrams : " PENSIONS " Colombo

දුරකථන / தொலைபேசி / Telephones: 2320316, 2421786, 2431305

ෆැක්ස් / பெக்ஸ் / Fax: 2342078


මගේ අංකය / எனது இல. / My No.: විවැ/චක්‍රලේඛ/2007

ඔබේ අංකය / உமது இல. / Your No.:

# විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
## ஓய்வூதியத் திணைக்களம்
## DEPARTMENT OF PENSIONS


මාලිගාවත්ත මහලේකම් කාර්යාලය,
මාලිගාවත්ත,
කොළඹ 10.

மாளிகாவத்தை செயலகம்,
மாளிகாவத்தை,
கொழும்பு 10.

Maligawatte Secretariat,
Maligawatte,
Colombo 10.


දිනය / திகதி / Date: 2007- 05- 07

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 10 / 2006 (II).

සියළුම දිසාපතිවරුන්/ ප්‍රාදේශීය ලේකම්වරුන්,
බැංකු කළමනාකරුවන්,
තැපැල් ස්ථානාධිපතිවරුන් වෙත,

**<u>රජයේ විශ්‍රාම වැටුප් ගෙවීම බැංකු පද්ධතිය හරහා ක්‍රියාත්මක කිරීම</u>**
**<u>විශ්‍රාම වැටුප් කුවිතාන්සි නිකුත් කිරීම</u>**

රජයේ විශ්‍රාම වැටුප් ගෙවීම බැංකු පද්ධතිය හරහා ක්‍රියාත්මක කිරීම සම්බන්ධව මවිසින් නිකුත් කරන ලද චක්‍රලේඛ 11/ 2005 10/ 2006, 19/ 2006, 10/ 2006 (1) හා ඊට අනුරූපී උපදෙස්වලට අමතර වශයෙනි.

විවිධ විශ්‍රාමික සංගම් හා විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විසින් සිදු කරනු ලැබූ ඉල්ලීම් පදනම් කරගෙන සියලුම විශ්‍රාමිකයන් වෙත යලිත් විශ්‍රාම වැටුප් කුවිතාන්සි පහත සඳහන් කොන්දේසිවලට යටත්ව යැවීමට තීරණය කර ඇත.

1) විශ්‍රාම වැටුප් කුවිතාන්සිය විශ්‍රාමිකයන් වෙත යැවෙන්නේ තොරතුරු දැන ගැනීම සඳහා පමණි.

2) මෙම කුවිතාන්සිය විශ්‍රාම වැටුප ලබාගැනීමට උපයෝගී කරගත යුතු නොවේ. ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් පෙර පරිදි බැංකු හා තැපැල් කාර්යාල වෙත Pay out Schedule යැවිය යුතුය. ඒ අනුව ගෙවීම් ක්‍රියාවලියෙහි වෙනසක් සිදු නොවේ.

3) විශ්‍රාම වැටුප් කුවිතාන්සි මුද්‍රණය හා තැපැල් වියදම් සඳහා ප්‍රාදේශිය ලේකම්වරුන් දිසා ලේකම්වරුන් මගින් ප්‍රතිපාදන ඉල්ලුම් කළ යුතු බව කාරුණිකව දන්වමි.

කේ. ඒ. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්:
1. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - දැ. ගැ. ස.
2. ලේකම් - මුදල් අමාත්‍යාංශය - දැ. ගැ. ස.
3. අයවැය අධ්‍යක්ෂ ජනරාල්/ භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් - දැ. ගැ. ස.
4. විගණකාධිපති